# ඇබෑර්තු

# ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව

## සෞඛ්‍ය අමාත්‍යාංශය

පහත සඳහන් ඇබෑර්තු පිරවීම සඳහා ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව හා බැඳෙන්නට කැමති කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කළ හැකි සුදුසුකම්ලත්, උද්යෝගිමත්, ස්වයං ගාමක, වෘත්තීය උන්නතිගාමී අයවලුන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

**සෑම අයදුම්කරුවෙක් ම,**

i. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

ii. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

iii. විශිෂ්ට චරිතයෙන් යුක්ත විය යුතුය.

### 01. කළමනාකරු - ඉංජිනේරු - විදුලි (MM 1-1-II වන ශ්‍රේණිය)

**සුදුසුකම් : බාහිර අපේක්ෂකයන්**

අ. (i) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන විශ්වවිද්‍යාලයක් වෙතින් ලබාගත් විදුලි ඉංජිනේරු විෂය ඇතුළත් BSc ඉංජිනේරු උපාධියක්

**හෝ**

(ii) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන විශ්වවිද්‍යාලයක් වෙතින් ලබාගත් ඕනෑම සමාන ඉංජිනේරු ප්‍රථම උපාධිය උපාධියක්

**හා**

(iii) රජයේ / සංස්ථාවක / මණ්ඩලයක / ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ පිළිගත් වෙළඳ ආයතනයක ඖෂධ / ආහාර පිළිබඳ විදුලි ඉංජිනේරු ක්ෂේත්‍රයට අදාළව අවම වශයෙන් වසර 03 ක පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද

**හෝ**

ජාතික තාක්ෂණ ඩිප්ලෝමා (NDT) සහතිකය (විදුලි) හෝ ඉංජිනේරු විද්‍යාව පිළිබඳ ජාතික ඩිප්ලෝමාව (NDES)

**සහ**

(v) රජයේ / සංස්ථාවක / මණ්ඩලයක / ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ පිළිගත් වෙළඳ ආයතනයක විදුලි ඉංජිනේරු ක්ෂේත්‍රයේ වසර අටක (08) පළපුරුද්දක් තිබීම. එයින් වසර තුනක් අධීක්ෂක මට්ටමේ විය යුතුය.

**සහ**

ආ. පරිගණක සාක්ෂරතාව

### 02. කළමනාකරු - තත්ත්ව පාලන (MM 1-1-II වන ශ්‍රේණිය)

**සුදුසුකම් : බාහිර අපේක්ෂකයන්**

අ. (i) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන විශ්වවිද්‍යාලයක් වෙතින් ලබාගත් ස්වභාවික විද්‍යාව පිළිබඳ පළමුවන හෝ දෙවන පන්තියේ (ඉහළ සාමාර්ථයක්) හෝ රසායන විද්‍යාවේ විශේෂ උපාධියක්

**හා**

(ii) රජයේ / සංස්ථාවක / මණ්ඩලයක / ව්‍යවසථාපිත මණ්ඩලයක හෝ පිළිගත් වෙළඳ ආයතනයක ඖෂධ පිළිබඳ විශ්ලේෂණ රසායන විද්‍යාව / තත්ත්ව පාලන, ක්ෂේත්‍රයට අදාළව අවම වශයෙන් වසර තුනක (03) පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද

**හෝ**

(iii) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන විශ්වවිද්‍යාලයක් වෙතින් ලබාගත් රසායන විද්‍යා විෂය ඇතුළත් BSc සාමාන්‍ය උපාධියක්

**සහ**

(i) රජයේ / සංස්ථාවක / මණ්ඩලයක / ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ පිළිගත් වෙළඳ ආයතනයක ඖෂධ පිළිබඳ විශ්ලේෂණ රසායන විද්‍යාව / තත්ත්ව පාලන ක්ෂේත්‍රයට අදාළව අවම වශයෙන් වසර පහක (05) පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද

**හා**

ආ. පරිගණක සාක්ෂරතාව

**සුදුසුකම් : තනතුරු 1 හා 2 සඳහා අභ්‍යන්තර අපේක්ෂකයන්**

**අභ්‍යන්තර අපේක්ෂකයන් (පහත 1 හෝ 2)**

01. බාහිර අපේක්ෂකයන් සඳහා අවශ්‍ය සුදුසුකම් ලබා තිබීම

02. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ කනිෂ්ඨ කළමනාකරු (JM 1-1) කාණ්ඩයේ තනතුරක අවම වශයෙන් වසර පහක (05) සාර්ථක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

### 03. නීති නිලධාරී (MM 1-1-II වන ශ්‍රේණිය)

**සුදුසුකම් : බාහිර අපේක්ෂකයන්**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන නීතිය පිළිබඳ ප්‍රථම උපාධියක් (LLB) සමග නීතිඥයෙකු වීම

**සහ**

රජයේ / සංස්ථාවක / මණ්ඩලයක / ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ පිළිගත් වෙළඳ ආයතනයක නීති ක්ෂේත්‍රයට අදාළව අවම වශයෙන් වසරක (01) පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද

**ඉහත තනතුර සඳහා අභ්‍යන්තර අපේක්ෂකයන්**

ඉහත බාහිර අපේක්ෂකයන් සඳහා අවශ්‍ය සුදුසුකම් ලබා තිබීම.

**ඉහත තනතුරු (1), (2) සහ (3) සඳහා පොදු**

- **වැටුප් පරිමාණය :** MM 1-1-රු. 53,175/- - 10 x 1,375/- - 15 x 1,910/- - 95,575/-

  ඉහත වැටුපට අමතරව රජය විසින් අනුමත කරන ලද දීමනා ගෙවනු ලැබේ.

- **වයස** : අවුරුදු 22 ට අඩු නොවිය යුතු අතර, අවුරුදු 45 ට වැඩි නොවිය යුතුය.

  ඉහළ වයස් සීමාව අභ්‍යන්තර අයදුම්කරුවන්ට අදාළ නොවේ.

- **බඳවා ගැනීමේ ක්‍රමය :** ලිඛිත තරගකාරී විභාගයක් හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්.

### 04. තත්ත්ව පාලන සහකාර තනතුර (MA-2-1-III වන ශ්‍රේණිය)

**සුදුසුකම් : බාහිර අපේක්ෂකයන්**

අ. අධ්‍යාපන / වෘත්තිය

(i) එකවර අ.පො.ස. (සා/පෙ) විභාගයේ සිංහල / දෙමළ, විද්‍යාව, ඉංග්‍රීසි හා ගණිතය ඇතුළු සම්මාන 04 ක් සහිතව විෂයන් 6 කින් සමත් වී තිබීම

**සහ**

(ii) අ.පො.ස. (උ/පෙළ) විභාගයේ රසායන විද්‍යාවට සම්මානයක් ඇතුළුව සම්මාන 2 ක් (පොදු සාමාන්‍ය ප්‍රශ්න පත්‍රයට හැර) සහිතව විද්‍යා විෂයන් 03 කින් සමත් වී තිබීම (නව විෂය නිර්දේශය)

**හෝ**

අ.පො.ස. (උ/පෙළ) විභාගයේ රසායන විද්‍යාවට සම්මානයක් ඇතුළුව සම්මාන 2 ක් සහිතව විද්‍යා විෂයන් 03 කින් සමත් වී තිබීම (පරණ විෂය නිර්දේශය)

**සහ**

(iii) පරිගණක සාක්ෂරතාවය අතිරේක සුදුසුකමක් ලෙස සලකනු ලැබේ.

**සහ**

(iv) පිළිගත් ඖෂධ නිෂ්පාදන ආයතනයක වසර දෙකක (02) පළපුරුද්ද

ආ. අභ්‍යාසලාභීන් බඳවා ගැනීම – ඉහත (i), (ii) හා (iii) සමග අභ්‍යාසලාභීන් බඳවා ගනු ලැබේ.

රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ පුහුණු තත්ත්ව පාලන සහායක ලෙස ආයතනය තුළ පවත්නා වසර 1 1/2 ක පුහුණු කාලය සම්පූර්ණ කර තිබීම (එය NVQ - 5 මට්ටමට සමානවේ) සමග ලිඛිත පරීක්ෂණය සමත් වීම, තත්ත්ව පාලන සහායක ලෙස ස්ථිර කාර්ය මණ්ඩලය සඳහා ඇතුලත් කර ගැනීමට පූර්ව අවශ්‍යතාවයකි.

ඇ. පුහුණු කාලය තුළ ඔවුන්ට දීමනාවක් ගෙවනු ලැබේ.

### 05. ගබඩා භාරකරු තනතුර (MA-2-1-III වන ශ්‍රේණිය)

**සුදුසුකම් : බාහිර අපේක්ෂකයන්**

අ. **අධ්‍යාපනික**

(i) එක් වර අ.පො.ස. (සා/පෙළ) විභාගයේ සිංහල / දෙමළ, ඉංග්‍රීසි, ගණිතය හා විද්‍යාව ඇතුළුව සම්මාන 04 ක් සහිතව විෂයන් 06 කින් සමත් වීම

**සහ**

(ii) අ.පො.ස. (උ/පෙළ) විභාගයේ (නව විෂය නිර්දේශය) විද්‍යා විෂය ධාරාවෙන් විෂයන් 02 කින් සමත් වීම

**හෝ**

අ.පො.ස. (උ/පෙළ) විභාගයේ (පරණ විෂය නිර්දේශය) විද්‍යා විෂය ධාරාවෙන් විෂයන් 02 කින් සමත් වීම

**සහ**

(iii) පරිගණක සාක්ෂරතාවය

**සහ**

ආ. රජයේ සංස්ථාවක / මණ්ඩලයක හෝ පිළිගත් වෙළඳ ආයතනයක අවම වශයෙන් වසරක (01) පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද

**සහ**

ඇ. **වෘත්තීය :**

NVQ - 5 මට්ටමට නොඅඩු මිලදී ගැනීම් හෝ තොග කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාව

**සුදුසුකම් : තනතුරු (4) හා (5) සඳහා අභ්‍යන්තර අපේක්ෂකයන්**

දෙවරකට නොවැඩි වාර ගණනකදී සිංහල / දෙමළ, ගණිතය, විද්‍යාව හා ඉංග්‍රීසි ඇතුළුව විෂයන් 04 කට සම්මාන සහිතව විෂයන් 06 කින් අ.පො.ස. (සා/පෙළ) විභාගය සමත්වූ හා වෘත්තීය සුදුසුකම් සමග ස්ථිර තනතුරක වසර 05 ක සතුටුදායක අඛණ්ඩ සේවාවක් සහිත ප්‍රාථමික මට්ටමේ නුපුහුණු, අර්ධ පුහුණු, පුහුණු කාණ්ඩවල රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ සේවකයෙකු වීම.

### 06. නඩත්තු තාක්ෂණික ශිල්පී - (විදුලි / විද්යුත් / යාන්ත්‍රික හා වායු සමීකරණ) - (MA 2-1-III වන ශ්‍රේණිය)

**සුදුසුකම් : බාහිර අපේක්ෂකයන්**

**අ. අධ්‍යාපනික / වෘත්තීය**

(i) අදාළ ක්ෂේත්‍රයේ කාර්මික විද්‍යාලකින් පවත්වනු ලබන මෙකාට්‍රොනික් විද්‍යාව පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව

**සහ**

රජයේ සංස්ථාවක, මණ්ඩලයක හෝ පිළිගත් වෙළඳ ආයතනයක අවම වශයෙන් වසරක (01) පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද

**හෝ**

(ii) ලංකා ජර්මානු කාර්මික පුහුණු ආයතනය විසින් පවත්වනු ලබන අදාළ ක්ෂේත්‍රයේ වසර හතරක (04) පාඨමාලාව සාර්ථකව නිමා කර තිබීම

**හා**

රජයේ සංස්ථාවක, මණ්ඩලයක හෝ පිළිගත් වෙළඳ ආයතනයක අවම වශයෙන් වසර දෙකක (02) පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද

**සුදුසුකම් : අභ්‍යන්තර අපේක්ෂකයන්**

දෙවරකට නොවැඩි වර ගණනකදී සිංහල / දෙමළ, ගණිතය හා ඉංග්‍රීසි ඇතුළුව විෂයන් 04 කට සම්මාන සහිතව විෂයන් 06 කින් අ.පො.ස. (සා/පෙළ) විභාගය සමත්වූ හා වෘත්තීය සුදුසුකම් සමග ස්ථිර තනතුරක වසර පහක (05) සතුටුදායක අඛණ්ඩ සේවාවක් සහිත ප්‍රාථමික මට්ටමේ නුපුහුණු, අර්ධ පුහුණු හා පුහුණු කාණ්ඩවල රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ සේවකයෙකු වීම.

**ඉහත සඳහන් (4), (5) හා (6) තනතුරු සඳහා පොදු කරුණු**

- **වැටුප් පරිමාණය :** MA 2-1-රු. 30,310/- - 10 x 300 - 7 x 350 - 4 x 495 - 20 x 660 - 50,940/-

- **වයස** : අවුරුදු 18 ට අඩු නොවිය යුතු අතර, අවුරුදු 45 ට වැඩි නොවිය යුතුය.

  උපරිම වයස් සීමාව අභ්‍යන්තර අපේක්ෂකයන් සඳහා අදාළ නොවේ.

- **බඳවා ගැනීමේ ක්‍රමය :** ලිඛිත තරගකාරී විභාගයක් හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකින්.

**ආන්තික ප්‍රතිලාභ**

❖ පැමිණීමේ හා කාර්ය සාධන දිරි දීමනා.

❖ භාවිතයට නොගත් වාර්ෂික හා අසනීප නිවාඩු සඳහා මුදල් ගෙවීම.

❖ වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය හා වෛද්‍ය වියදම් සඳහා වැය වූ මුදල් ප්‍රතිපූර්ණය කිරීම.

❖ සේවක අර්ථසාධක අරමුදල සඳහා සේවකයා විසින් 10% ප්‍රමාණයක් මාසික වැටුපෙන් ගෙවිය යුතු අතර, සංස්ථාව විසින් ඒ සඳහා 15% ක දායකත්වයක් දරනු ලබයි.

❖ ඊට අමතරව සංස්ථාව විසින් 3% ප්‍රමාණයකින් සේවක භාර අරමුදලට ද දායකත්වය ලබාදෙනු ඇත.

❖ 1983 අංක 12 දරන පාරිතෝෂික දීමනා පනත හා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛ ප්‍රකාරව පාරිතෝෂිත දීමනා ගෙවනු ලැබේ.

❖ අනෙකුත් ආන්තික ප්‍රතිලාභ.

**පොදු කොන්දේසි**

❖ නිර්දේශිත ආකෘතිවලම සකස් කළ අයදුම්පත් ඥාති නොවන නිර්දේශකයන් දෙදෙනෙකුගේ නම්, ලිපිනයන් හා ඇමතුම් අංක සමග ඉදිරිපත් කළ යුතුය. සියලුම අධ්‍යාපනික සහතිකවල සහතික කළ පිටපත් අයදුම්පතට අමුණා තිබිය යුතුය. අදාළ අයදුම්පත රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ නිල වෙබ් අඩවිය වන http://www.spmc.gov.lk වෙතින් බාගත කළ හැක.

❖ රජයේ දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවකයන්ගේ අයදුම්පත්, අදාළ ආයතන ප්‍රධානී මාර්ගයෙන් යොමුකළ යුතු අතර, ඔහු විසින් අදාළ අයදුම්කරු මෙම තනතුරුවලට තෝරාගතහොත් දැනට දරන තනතුරින් නිදහස් කළ හැකිද යන්න සඳහන් කළ යුතුය.

❖ අයදුම්පත් බහාලූ කවරයේ වම් ඉහළ කෙළවරේ අයදුම් කරනු ලබන තනතුර සඳහන් කළ යුතු අතර, පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන්, මෙම දැන්වීම පළවී දින 10 ක් ඇතුළත ලැබීමට සැලැස්විය යුතුය.

❖ ඉහත අවශ්‍යතා සපුරාලනු නොලබන අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරේ.

**සභාපති, රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව,**
**අංක 11, ශ්‍රීමත් ජෝන් කොතලාවල මාවත,**
**කඳවල වත්ත, රත්මලාන.**